# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය

**ප්‍රාථමික බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනය හා සාහිත්‍ය විචාරය BUCU – 18224**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ
ප්‍රශ්න **පහකට** (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### 1 කොටස

01. සිගාලෝවාද සූත්‍රය හඳුන්වාදෙමින් ගෘහ ජීවිතය විනයවත් කිරීම අරඹයා එහි දැක්වෙන ඉගැන්වීම් විරති හා සමාදාන වශයෙන් ප්‍රභේදගත කළ හැකි අයුරු පෙන්වා දෙන්න.

02. බුදුසිරිත කෙරෙන් ප්‍රකට වන මානුෂීය ගුණාංග කවරේදැයි මහාපරිනිබ්බාණ සූත්‍රාගත තොරතුරු ඇසුරින් ප්‍රකට කරන්න.

03. සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ විග්‍රහය ප්‍රකට කිරීමෙහිලා දීඝනිකායේ සක්කපඤ්ඤ සූත්‍රයේ අන්තර්ගතය ඉවහල් කරගත හැකි අයුරු විභාග කරන්න.

04. භික්ෂු සමාජයේ සංවිධානමය පසුබිම අධ්‍යයනය කිරීමෙහිලා මහාවග්ගපාලියේ මහාඛන්ධකයේ දැක්වෙන කවර කරුණු අදාළ කරගත හැකිදැයි පරීක්ෂා කරන්න.

05. භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ ශික්ෂාපද සංග්‍රහ වී ඇති අයුරු දක්වා සේඛියා ධර්මයන්හි සංස්කෘතික වටිනාකම අගය කරන්න.

### 11 කොටස

06. චරිත නිරූපණයේ දී ශ්‍රාවක අවධානය තම ග්‍රහණයට නතුකර ගැනීමෙහිලා විද්‍යාචක්‍රවර්තීන් තුළ පැවති නිසග ප්‍රතිභාව බුත්සරණ ඇසුරින් අගය කරන්න.

07. අවස්ථාවෝචිත උපමා භාවිත කිරීමේ දී සද්ධර්මරත්නාවලිය කතුවරයාණන් දක්වා ඇති පරිචය කොතෙක්දුරට සාර්ථකවීදැයි සාකච්ඡා කරන්න.

08. තත්කාලීන සමාජ තොරතුරු අධ්‍යයනයෙහි ලා වංසකතා සාහිත්‍යයෙන් ලැබෙන පිටිවහල කුරුණෑගල යුගයට අයත් එක් වංසකතාවක් ඇසුරින් ප්‍රමාණ කරන්න.

09. බෞද්ධ මහා කාව්‍ය ග්‍රන්ථයක් ලෙස කව්සිළුමිණ අගය කළ හැකි අයුරු පරීක්ෂා කරන්න.

10. සාම්ප්‍රදායික බෞද්ධ කතාප්‍රවෘත්ති නූතන සිංහල නාට්‍ය නිර්මාණකරණය සඳහා වස්තුවිෂය කරගත් අයුරු ජෝන් ද සිල්වා නාට්‍ය ඇසුරින් පෙන්වා දෙන්න.

**********************************